සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	11 ශ්‍රේණිය	පුරවැසි අධ්‍යාපනය I	කාලය / நேரம் / Time	පැය 01යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

★ **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01. ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ පාලනය මෙහෙය වූ ආයතනය හැඳින්වීමට භාවිතා කළ නාමය වන්නේ,
1. පාර්ලිමේන්තුව
2. කැබිනට් මණ්ඩලය
3. පුරවැසි සභාව
4. උත්තර මන්ත්‍රී මණ්ඩලය

02. ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තු බලය වර්ධනය වීමේ ක්‍රියාවලිය ආරම්භ වූ අවස්ථාව කුමක් ද?
1. ඉංග්‍රීසි විප්ලවය
2. රුසියන් විප්ලවය
3. ඇමරිකානු නිදහස් සටන
4. ප්‍රංශ විප්ලවය

03. බහු පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,
1. ඇමරිකාව, මහා බ්‍රිතාන්‍ය
2. ශ්‍රී ලංකාව, මහා බ්‍රිතාන්‍ය
3. ඉන්දියාව, ඇමරිකාව
4. ඉන්දියාව, ශ්‍රී ලංකාව

04. රටක නීති සම්පාදනය කරන ආයතනය වන්නේ,
1. ව්‍යවස්ථාදායකයයි
2. අධිකරණයයි
3. ආණ්ඩුවයි
4. උත්තර මන්ත්‍රී මණ්ඩලය

05. මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන බලතල වලින් කොටසක් පාර්ලිමේන්තු පනතක් හරහා ප්‍රාදේශීය පාලන ආයතන වෙත පවරා දීමෙන් සිදු වන්නේ බලය,
1. බෙදා හැරීමයි
2. විමධ්‍යගත වීමයි
3. පවරා දීමයි
4. මධ්‍යගත කිරීමයි

06. ප්‍රජාතන්ත්‍රවාදී රටක පාලන කටයුතු සඳහා ජනතාව සතු බලය හැඳින්වෙන්නේ කුමන නමින් ද?
1. අධිකරණ බලය
2. උත්තරීතර බලය
3. පරමාධිපත්‍ය බලය
4. ව්‍යවස්ථාදායක බලය

පහත ප්‍රකාශ ඇසුරින් (07) හා (08) ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තෝරා ගැනීම
B. ව්‍යවස්ථාදායකය මගින් සෘජුව විධායකය පාලනය කිරීමක් සිදු නොවේ.
C. ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සෘජු සම්බන්ධයක් ඇත.
D. විධායකය ව්‍යවස්ථාදායකයට සෘජුව වග නොකියයි.

07. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ ඇතුළත් වගන්තිය වන්නේ,
1. A, C
2. B, D
3. D, B
4. A, B

08. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ ඇතුළත් වගන්තිය වන්නේ,
1. A, B
2. B, C
3. A, C
4. B, D

Past Papers Wiki

09. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
1. අභ්‍යන්තර හා බාහිර කටයුතු සම්බන්ධයෙන් ස්වාධිපති බලය හිමි නොවීම
2. ව්‍යක්තීය නිලබල පැලැන්තියක් මගින් පාලන බලය මෙහෙය වීම
3. භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍ය බලය යන සංකල්ප මත පදනම් නොවීම
4. එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් නොවීම

10. සදාචාරාත්මක යුතුකමක් වන්නේ,
1. රජයට නියමිත බදු ගෙවීම
2. පවතින නීතියට ගරු කිරීම
3. නීතිය හා සාමය ආරක්ෂා කිරීම
4. වැඩිහිටියන්ට ගරු කිරීම

11. ස්විට්සර්ලන්තයේ සන්ධීය මහා මණ්ඩලයට අයත් ආයතන නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?
1. ජාතික සභාව හා රාජ්‍ය සභාව
2. රාජ්‍ය සභාව හා ලොක් සභාව
3. ජාතික සභාව හා ලොක් සභාව
4. රාජ්‍ය සභාව හා සෙනෙට් සභාව

12. ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත රාජ්‍යයන්ට හිමි බලතල වන්නේ,
1. අධ්‍යාපනය, මූල්‍ය කටයුතු
2. අධ්‍යාපනය, සෞඛ්‍යය
3. සෞඛ්‍යය, මූල්‍ය කටයුතු
4. අධ්‍යාපනය, ජාතික ආරක්ෂාව

13. බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංගයක් නොවන්නේ,
1. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම
2. අන්‍ය ආගම් වලට අවමන් නොකිරීම
3. සාමූහිකත්වයෙන් කටයුතු කිරීම
4. ගැටුම් ඇතිවන සේ කටයුතු කිරීම

14. මධ්‍යම ආණ්ඩුවේ බලතල පමණක් ව්‍යවස්ථාවට ඇතුලත් කර ඉතිරි සියලු බලතල ප්‍රාන්ත වලට හිමිකර දී ඇති සන්ධීය රාජ්‍ය වන්නේ,
1. ඉන්දියාව
2. ඇමරිකාව
3. ප්‍රංශය
4. ස්විට්සර්ලන්තය

15. යහපාලනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. අල්ලස හා දූෂණය ඉහළ යාම
2. රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම
3. රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාවට නැංවීම කෙරෙහි ජනතා සහභාගීත්වය නොමැති වීම.
4. පුරවැසි යුතුකම් හා සමාජ සාධාරණත්වය සුරැකෙන පරිදි නීතිගරුකව විනිවිදභාවයෙන් වංචා හා දූෂණයෙන් තොරව කටයුතු කිරීම

16. ශ්‍රී ලංකාවේ ඓතිහාසික වැදගත්කමක් ඇති පූජනීය ස්ථානයක් නොවන්නේ,
1. දඹුල්ල විහාරය
2. ජය ශ්‍රී මහා බෝධිය
3. රුවන්වැලි සෑය
4. ගාලු කොටුව

17. ආර්ථිකයක් තුළ සිදු වන ප්‍රධාන ක්‍රියාවලි 3 ක් ඇතුලත් පිළිතුර වන්නේ,
1. නිෂ්පාදනය, පරිභෝජනය, ගිණුම්කරණය
2. නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය
3. පරිභෝජනය, බෙදාහැරීම, මිලදී ගැනීම
4. නිෂ්පාදනය, අලෙවිය, පරිභෝජනය

18. මූලික ආර්ථික ප්‍රශ්න ගණයට ඇතුලත් නොවන්නේ,
1. කුමන අමුද්‍රව්‍ය යොදා නිෂ්පාදනය කරන්නේ ද?
2. කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේ ද?
3. කෙසේ නිෂ්පාදනය කරන්නේ ද?
4. කවුරුන් උදෙසා නිෂ්පාදනය කරන්නේ ද?

19. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සෘජුවම යොදා ගන්නා භාණ්ඩ හඳුන්වන්නේ කෙසේ ද?
1. අන්තර් භාණ්ඩ
2. ප්‍රාග්ධන භාණ්ඩ
3. පාරිභෝගික භාණ්ඩ
4. නිමි භාණ්ඩ

20. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය මෙරටට හඳුන්වා දුන්නේ,
1. 1978 දී
2. 1972 දී
3. 1956 දී
4. 1994 දී

21. භාණ්ඩ නිෂ්පාදනයේදී මිනිස් ශ්‍රමය බහුලව යොදා ගන්නා කර්මාන්ත හඳුන්වන්නේ,
1. ප්‍රාග්ධන සූක්ෂම ලෙසය
2. හස්ත කර්මාන්ත ලෙසය
3. ගෘහ කර්මාන්ත ලෙසය
4. ශ්‍රම සූක්ෂම ලෙසය

22. ගැටුම් නිරාකරණය සඳහා යොදාගනු ලබන සාම්ප්‍රදායික ක්‍රමයක් වන්නේ,
1. බෙරුම්කරණය
2. උපදේශනය
3. විනිසීම
4. සමථකරණය

23. ගැටුම් ඇතිවීමට බලපාන සමාජ ආර්ථික සාධකයක් නොවන්නේ,
1. දරිද්‍රතාව
2. ගෝත්‍ර
3. වෙළෙඳපොළ
4. සම්පත්

24. ගැටුම් නිරාකරණය සඳහා මැදිහත්කරුවකු තෝරා ගැනීමේදී අවධානය යොමු කළ යුතු කරුණක් වන්නේ,
1. දෙපාර්ෂවයටම බලපෑම් කළ හැකි වීම
2. ආගමික ස්ථානයක හැදී වැඩුනු අයකු නොවීම
3. දෙපාර්ෂවයම පිළිගන්නා අපක්ෂපාතී පුද්ගලයකු වීම
4. ඉවසීමක් නැති අයකු වීම

25. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය වන්නේ,
1. රෝම ලන්දේසි නීතිය
2. උඩරට නීතිය
3. තේසවලාමේ නීතිය
4. මුස්ලිම් නීතිය

26. නීතියේ මූලාශ්‍රයක් නොවන්නේ,
1. ආගම
2. පුවත්පත්
3. සිරිත් විරිත්
4. ව්‍යවස්ථා

27. ශ්‍රී ලංකාවේ අධිකරණය සංකේතවත් කරන දෙවඟන ලෙස සැලකෙන්නේ,
1. සියුස්
2. ශිව
3. පාර්වතී
4. ඇතීනා

28. අධිකරණ සේවා කොමිසමේ සභාපතිවරයා වන්නේ,
1. අගවිනිසුරු ය
2. නීතිපති ය
3. ජනාධිපති ය
4. අගමැති ය

29. මුස්ලිම් විවාහ ගැටලු විසඳීම සඳහා යොදා ගන්නේ,
1. ගෙවල් කුලී මණ්ඩලය
2. කාති උසාවි
3. සමථ මණ්ඩලය
4. කම්කරු විනිශ්චය සභාව

30. ශ්‍රී ලංකාවට සර්වජන ඡන්ද බලය හඳුන්වා දෙනු ලැබුවේ,
1. 1931
2. 1947
3. 1972
4. 1833

31. ශ්‍රී ලංකාවට විධායක ජනාධිපති ධූරය හඳුන්වා දෙන ලද ආණ්ඩු ක්‍රමය වන්නේ,
1. 1972 I ජනරජ ආණ්ඩු ක්‍රමය
2. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය
3. 1978 II ජනරජ ආණ්ඩු ක්‍රමය
4. 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමය

32. මූලික අයිතිවාසිකම් යනුවෙන් හැඳින්වෙන්නේ,
1. නිදහසේ ජීවත් වීමට ඇති අයිතිය
2. කැමති රැකියාවක් කිරීමට ඇති අයිතිය
3. කැමති ආගමක් ඇදහීමට ඇති අයිතිය
4. යම් රටවල් තම මූලික නීතියට ඇතුළත් කර ඇති අයිතිවාසිකම්

33. මානව අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථාවක් නොවන්නේ,
1. වැඩවසම් ක්‍රමය බිඳ වැටීම
2. මැග්නා කාර්ටා ගිවිසුම
3. රුසියානු විප්ලවය
4. ඇමරිකානු නිදහස් ප්‍රකාශනය

34. ආර්ථික උපකාරක සේවාවක් වන්නේ,
1. ඛනිජ චක්‍රය
2. පරිසර පද්ධතිය
3. ජල චක්‍රය
4. ජල විදුලිය

35. සංවර්ධනය මැනීමේ නූතන මිනුමක් වන්නේ,
1. ආර්ථික වර්ධන වේගය
2. මානව සංවර්ධන දර්ශකය
3. දළ ජාතික නිෂ්පාදිතය
4. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය

36. තිරසාර සංවර්ධනය සඳහා පුරවැසි යුතුකමක් වන්නේ,
1. පරිසර හිතකාමී ජීවන රටාව
2. නීතිරීති වලට අනුගත නොවීම
3. අධි පරිභෝජනය
4. නිසි ලෙස අපද්‍රව්‍ය බැහැර නොකිරීම

37. ජාත්‍යන්තර සබඳතා ගොඩනගා ගැනීමෙන් ඇතිවන යහපත් ප්‍රතිඵලයක් නොවන්නේ,
1. තාක්ෂණික දැනුම හුවමාරු කර ගැනීම
2. සාරධර්ම පරිහානියට පත්වීම
3. නව රැකියා උදාවීම
4. අන්‍යොන්‍ය ආධාර උපකාර ලැබීම

38. ශ්‍රී ලංකාවේ රැකියා වෙළඳපොළ නිර්මාණය කර දීම සම්බන්ධයෙන් විශේෂ ස්ථානයක් හිමි වන්නේ,
1. ඕස්ට්‍රේලියාව හා ඇමරිකාව
2. මැද පෙරදිග රටවල් හා ඇමරිකාව
3. ඉන්දියාව හා උතුරු කොරියාව
4. මැද පෙරදිග රටවල් හා දකුණු කොරියාව

39. ජාත්‍යන්තර වෙළෙඳාම තුළ භාවිතා වන ප්‍රබල මුදල් ඒකක වන්නේ,
1. යුරෝ, ඉන්දීය රුපියල්
2. ඇමෙරිකානු ඩොලර්, ඉන්දීය රුපියල්
3. යුරෝ, ඇමරිකානු ඩොලර්
4. ජපන් යෙන්, ඉන්දීය රුපියල්

40. විදේශ වෙළඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධානයක් වන්නේ,
1. ලෝක බැංකුව
2. ඔපෙක් සංවිධානය
3. සාර්ක් සංවිධානය
4. ගැට් සංවිධානය

(ලකුණු 1 x 40 = 40)

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11 ශ්‍රේණිය	පුරවැසි අධ්‍යාපනය II	කාලය நேரம் Time: පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

අමතර කියවීම් කාලය මි.10යි

★ **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
★ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව, ප්‍රශ්න පහකට පිලිතුරු සපයන්න.**

(01)

1. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සීලර් ඉදිරිපත් කරන ලද නිර්වචනය සඳහන් කරන්න.
2. යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍ය දෙක කුමක් ද?
3. ඒකීය ආණ්ඩු ක්‍රම පවතින රාජ්‍යයන්ට නිදසුන් 2 ක් ලියන්න.
4. ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ඇතිකළ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කුමක් ද?
5. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට බලපෑ සාධක 2 ක් සඳහන් කරන්න.
6. ජොහාන් ගැල්ටුන්ගේ ගැටුම් ත්‍රිකෝණයේ අවස්ථා 2 ක් නම් කරන්න.
7. ශ්‍රී ලංකාවේ දේශීය නීතියේ ප්‍රභේද 2 ක් ලියන්න.
8. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් 02 ක් ලියන්න.
9. ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වනු ලබන ආකාර දෙක ලියන්න.
10. ශ්‍රී ලංකාවට විදේශ ණය ආධාර සපයන මූල්‍ය ආයතන 2 ක් ලියන්න.

(ලකුණු 02x10=20 යි.)

(02)

1. දේශපාලන පක්ෂයක් යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 02)
2. දේශපාලන පක්ෂ ක්‍රමයේ විවිධ ස්වරූප තුන සඳහන් කර ඒවා ක්‍රියාත්මක වන රට බැගින් ලියන්න. (ලකුණු 03)
3. (a) තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ 3 ක් සඳහන් කරන්න. (ලකුණු 03)
   (b) ඉන් එක් ලක්ෂණයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(03)

1. ගෝලීයකරණය යනු කුමක්දැයි සඳහන් කරන්න. (ලකුණු 02)
2. ගෝලීයකරණය නිසා ලෝක ආර්ථිකය තුළ දක්නට ඇති ලක්ෂණ 3 ක් සඳහන් කරන්න. (ලකුණු 03)
3. (a) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇති වී තිබෙන ධනාත්මක බලපෑම් 3 ක් සඳහන් කරන්න. (ලකුණු 03)
   (b) එක් ධනාත්මක බලපෑමක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(04)

1. අන්තර්ජාතික ගැටුම් වල ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)
2. ගැටුම් නිරාකරණය සඳහා මැදිහත්කරුවකු තුල තිබිය යුතු ගුණාංග 3 ක් ලියන්න. (ලකුණු 03)
3. (a) සාමකාමී ලෙස ගැටුම් නිරාකරණය කර ගැනීමේ වාසි තුනක් ලියන්න. (ලකුණු 03)
   (b) ඉහත සඳහන් කළ එක් කරුණක් විස්තර කරන්න. (ලකුණු 02)

PAST PAPERS WIKI

(05) 1. ශ්‍රී ලංකාව තුළ විශේෂ පාර්ලිමේන්තු පනත් මගින් පිහිටුවා ඇති අධිකරණ ආයතන 2 ක් නම් කරන්න. (ලකුණු 02)

2. ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලතල 03 ක් නම් කරන්න. (ලකුණු 03)

3. (a) නීතියේ ආධිපත්‍ය තහවුරු වී තිබෙන සමාජයක දැකිය හැකි ලක්ෂණ 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(b) අධිකරණයේ ස්වාධීනත්වය සුරැකීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග 2 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(06) 1. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේදී අවධානය යොමු කෙරුණු සුවිශේෂී කරුණු හතරෙන් 02 ක් ලියන්න. (ලකුණු 02)

2. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මගින් සහතික කර ඇති අයිතිවාසිකම් 3 ක් ලියන්න. (ලකුණු 03)

3. (a) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග 3 ක් ලියන්න. (ලකුණු 03)

(b) ඉන් එක් ක්‍රියාමාර්ගයක් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(07) 1. ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වීමෙහිලා බලපා ඇති සාධක 2 ක් ලියන්න. (ලකුණු 02)

2. ජාත්‍යන්තර සම්බන්ධතා වලදී බලවත් රාජ්‍ය විසින් දුබල රාජ්‍යන් වෙත බලපෑම් ඇතිකරන ක්ෂේත්‍ර 3 ක් ලියන්න. (ලකුණු 03)

3. (a) කලාපීය සංවිධාන බිහිවීමේදී පදනම් වී ඇති ප්‍රධාන අරමුණු 02 නම් කරන්න. (ලකුණු 03)

(b) ඉහත එක් අරමුණක් යටතේ බිහි වී ඇති කලාපීය සංවිධාන 2 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank